සැ. යු.– 2006.12.29 දින පළවූ අංක 1478 දරන ගැසට් පත්‍රයේ I/II (අ) කොටස හා IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,479- 2007 ජනවාරි 05 වැනි සිකුරාදා - 2007.01.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 02 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 07 |
| නාවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජනවාරි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නිවේදන

## ග්‍රාම නාම වෙනස් කිරීම

මෙහි පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ දැක්වෙන ග්‍රාම නාමය, දෙවැනි උපලේඛනය ප්‍රකාරව වෙනස් කර ඇති බව පොදු දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය සරත් අමුණුගම,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2006 දෙසැම්බර් මස 06 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී වසම* | *පළමුවැනි උපලේඛනය* | *දෙවැනි උපලේඛනය* |
|---|---|---|---|---|
| කුරුණෑගල | වාරියපොල | 1241–ඇඹව | රදාගම | රන්සිරිගම |

01-58

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/බ/37.

## 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්තිය යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග

3 (6) (අ), (ආ), (ඇ), (ඈ), යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, ගාවෙල, සිරි විමලාරාම විහාරස්ථානයේ පිහිටි බ/සිරි සද්ධර්මෝදය පිරිවෙන 2005.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරින් වහන්සේ වන ගරු කන්දකැටියේ අරියධම්ම ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3 (6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2006 දෙසැම්බර් මස 07 වන දින,
'ඉසුරුපායේ',
බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

01-46

---

එල්. ඩී. බී. 132/29(11).

## රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනත

(283 වන අධිකාරය වූ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය විසින් සාදනු ලැබ, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ රීති.

ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2006 දෙසැම්බර් මස 12 වන දින,
කොළඹ දී ය.

### රීති

වරින්වර සංශෝධිත සහ 2004 මැයි මස 14 වන දින අංක 1341 දරන *ගැසට් පත්‍රය* මගින් අවසන්වරට සංශෝධිත, 1892 ජුනි මස 17 වන දින අංක 5147 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රීති, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :

(1) 1 වන පරිච්ඡේදය - "පොදු ව්‍යවස්ථා" යන ශීර්ෂය යටතේ

*(අ)* (1) (i) වන රීතියේ
"අවුරුදු 35 හෝ ඊට අඩු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවුරුදු 40 ක් හෝ ඊට අඩු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

*(ආ)* (1) (i) (අ) රීතිය ඉවත් කිරීමෙන් ;

*(ඇ)* 1 (ii) වන රීතියේ "අවුරුදු 35 ක් හෝ ඊට අඩු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවුරුදු 40 ක් හෝ ඊට අඩු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

*(ඈ)* 13 (ii) වන රීතිය යටතේ වූ

"හිමි ණය මුදල" යන ශීර්ෂය යටතේ වූ 1 සිට 7 දක්වා අයිතම වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් :-

| | සාමාජිකත්ව කාල සීමාව | දායක මුදල 5% වඩා අඩු වූ විට | දායක මුදල 5% හෝ ඊට වඩා වැඩි වූ විට | ආපසු ගෙවන වාරික ගණන | අදාල වෙනත් අවශ්‍යතා |
|---|---|---|---|---|---|
| 1. | මාස 6 කට නො අඩු සහ මාස 12 කට නොවැඩි සාමාජිකයෙකුට | රු. 1,500 | රු. 3,000 | 10 | සේවය ස්ථිර කිරීම අවශ්‍ය නොවේ. |
| 2. | වසර 1 කට නොඅඩු වසර 3 කට නොවැඩි සාමාජිකයෙකුට | රු. 3,000 | රු. 5,000 | 20 | එම |
| 3. | වසර 3 කට නොඅඩු සහ වසර 5 කට නොවැඩි සාමාජිකයෙකුට | මාස දෙකක ඒකාබද්ධ වැටුප (උපරිමය, රු. 20,000) | මාස තුනක ඒකාබද්ධ වැටුප (උපරිමය රු. 25,000) | 48 | සේවය ස්ථිර කර තිබිය යුතු අතර 5% දායක මුදලක් අඛණ්ඩව දිගමට ගෙවිය යුතු ය. |
| 4 | වසර 5 කට නොඅඩු සහ වසර 7 කට නොවැඩි සාමාජිකයෙකුට | මාස හතරක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප උපරිමය (රු. 35,000) | මාස පහක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප උපරිමය (රු. 40,000) | 48 | සේවය ස්ථිර කර තිබිය යුතුය. දායක මුදලින් දෙන ණය මුදල බැරට ඇති මුදලින් අඩකට සීමා කෙරේ. 5% දායක මුදල් අඛණ්ඩව දිගටම ගෙවිය යුතුය. |
| 5 | වසර 7 කට නොඅඩු සහ වසර 12 කට නොවැඩි සාමාජිකයෙකුට | මාස හයක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 50,000) | මාස අටක වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය, රු. 60,000) | 48 | එම |
| 6 | වසර 12 කට වඩා වැඩි සාමාජිකයෙකුට | මාස හයක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 70,000) | මාස අටක ඒකාබද්ධ වැටුප/විශ්‍රාම වැටුප (උපරිමය රු. 75,000) | 48 | එම |
| 7 | වයස අවුරුදු 55 ට එළඹීමට පෙර විශ්‍රාම ගෙන තම ණය මුදල් දායක මුදලින් හිලව් කර ඇති සාමාජිකයෙකුට වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් | මාස තුනක විශ්‍රාම වැටුප (උපරිමය, රු. 15,000) | මාස පහක විශ්‍රාම වැටුප (උපරිමය රු. 30,000) | 48 | විශ්‍රාම වැටුපෙන් අය විය යුතුය. දායක මුදලින් දෙන ණය මුදල බැරට ඇති දායක මුදලින් අඩකට සීමා කෙරේ. 5% දායක මුදල දිගටම ගෙවිය යුතුය. |
| 8 | 14 වන රීතිය යටතේ ණය ලබා නොගත් ප්‍රදානමිත සාමාජිකයෙකුට | මාස හතරක විශ්‍රාම වැටුප (උපරිමය රු. 25,000) | – | 48 | 14 වන රීතිය යටතේ ණය ලබා ගැනීමට හිමිකමක් නොමැත. විශ්‍රාම වැටුපෙන් වාරික මුදල් අය කර ගත යුතුය. |

(ඉ) 13(v) (අ) රීතියේ "අනුගාමී මාසික වාරික 36 කට නොවැඩි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අනුගාමී මාසික වාරික හතලිස් අටකට (48) නොවැඩි" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඊ) 13 (ඇ) රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"13. (ඇ) එක් වර්ෂයක සාමාජිකත්වය සම්පූර්ණ කළ යම් සාමාජිකයෙකුට මාසික වාරික දහයකින් (10) ආපසු ගෙවනු ලබන රු. 5,000 ක උත්සව ණය මුදලක් ගෙවිය හැකිය."

(උ) 13(අ) රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :

"13. (ඌ) වසර පහකට වඩා වැඩි සාමාජිකත්වයක් ඇති සාමාජිකයකුගේ ළමයකු අ.පො.ස. (උ. පෙ.) විභාගය සමත් වූ අවස්ථාවක දී රුපියල් දස දහසක් (රු.10,000) නොඉක්මවන ණය මුදලක් එම සාමාජිකයාට ප්‍රදානය කරනු ලැබිය හැකි ය. එකී ළමයා පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උසස් අධ්‍යාපන පාඨමාලාවක් හදාරමින් සිටින බව තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම ණය මුදල ප්‍රදානය කළ යුතුය. මෙම ණය මුදල වසරකට සියයට 10 ක (10%) පොලී අනුපාතිකයක් සහිතව සමාන මාසික වාරික 36 කින් නැවත ගෙවා නිම කළ යුතුය.

එසේ වුව ද, මෙම ණය මුදල සාමාජිකයාගේ මාසික වැටුපෙන් 40% ක අවම අඩු කිරීමේ සීමාවට යටත්ව එම සාමාජිකයාගේ මාසික වැටුපෙන් වාරික මුදල් අඩුකර ගැනීමේ හැකියාව සැලකිල්ලට ගැනීමෙන් පසුව ප්‍රදානය කරනු ලැබිය යුතුය.”

(එ) 14(2) රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :-

“14(3) (i) අවුරුදු පහකට වඩා වැඩි කාලයක් සඳහා වලංගු සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකු දරුණු රෝගයකින් පෙළෙන අවස්ථාවක දී රුපියල් පනස් දහසක් (රු. 50,000) නොඉක්මවන පරිත්‍යාගයක් එම සාමාජිකයාට ප්‍රදානය කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

(ii) රජයේ හෝ පිළිගත් පෞද්ගලික වෛද්‍ය ආයතනයක වෛද්‍ය වෘත්තිකයකුගෙන් ලබා ගත් සහතිකයක් ඉදිරිපත් කිරීම මත කළමනාකරණ කමිටුව විසින් එවැනි පරිත්‍යාගයක් ප්‍රදානය කිරීම පිළිබඳව තීරණය කළ යුතු ය.

(iii) වෛද්‍ය වෘත්තිකයා විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් සාමාජිකයාගේ රෝගයේ බරපතලභාවය පිළිබඳව ප්‍රකාශ කළ යුතු අතර, එකී රෝගය සුව කිරීම සඳහා තවදුරටත් ප්‍රතිකාර අවශ්‍ය බව ප්‍රකාශ කළ යුතු ය.

(iv) සංගමයේ සෑම සාමාජිකයෙකු විසින් ම මාසිකව රුපියල් දහයක් (රු.10) බැර කළ යුතු “වෛද්‍ය පරිත්‍යාග අරමුදල” යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම නීත්‍යානුකූල වන්නේ ය.”

(ඒ) 15(i) වන රීතියේ “ණය මුදල තම දායක මුදල්වලට හර කිරීමය යන මේ දෙකෙන් කැමති එකක් තෝරා ගැනීමට ඔහුට පුළුවන. ණය මුදල තම දායක මුදලට “යන වචන වෙනුවට” ණය මුදල දායක මුදල් වලට, ලාභාංශවලට සහ පොළියට හර කිරීමය යන මේ දෙකෙන් කැමති එකක් තෝරා ගැනීමට ඔහුට පුළුවන. ණය මුදල තම දායක මුදල්වලට, ලාභාංශවලට සහ පොළියට” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

01-41

---

එල්.ඩී.- බී 277/40

## (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

19 වන වගන්තිය යටතේ දැන්වීම

මෙහි පහත දැක්වෙන ස්මාරක (188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්යය සඳහා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරමින් එකී ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරනු ලබන බව සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ස්මාරක වල ලැයිස්තුව

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ, කඳුබොඩ ග්‍රාමයේ පිහිටි නිකසලා ආරණ්‍ය සේනාසන භූමියට අයත් ලෙන් ලිපිය සහිත කටාරම් කෙටූ ලෙන සහ පැරණි පොකුණු දෙක.
2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, හිරිපොකුණ ග්‍රාම නිලධාරි වසමේ, නිකපිටිය ග්‍රාමයේ පිහිටි පන්සල්හේනවත්ත ඉඩමට අයත් පැරණි දාගැබ් ගොඩැල්ල, පෝය ගෙය සහ ගල්කුළුණු සහිත භූමිය.
3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මුණිහිරිගම ග්‍රාම නිලධාරි වසමේ, ගල්කන්ද ග්‍රාමයේ පිහිටි වෙහෙරගල විහාරස්ථාන භූමියට අයත් දාගැබ් ගොඩැල්ල, පැරණි ගොඩනැගිලි දෙක සහ පොකුණ.
4. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කන්දේගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කන්දේ මැදගම මහා චෛතියගිරි විහාර භූමියට අයත් දාගැබ, බෝධිඝරය, සංරක්ෂිත ගොඩනැගිලි දෙක, කටාරම් සහිත ලෙන් විහාරය, ලෙන් ලිපිය සහිත ලෙන සහ අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ.
5. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කන්දේ මැදගම ග්‍රාම නිලධාරි වසමේ, මැදගම කන්දේ පිහිටි විජය සොහොන.
6. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බමුණුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බමුණුමුල්ල බතලගොඩ වැව ඉස්මත්තේ ඇති දාගැබ් ගොඩැල්ල සහ ටැම්පිට විහාරයට අයත් අවශේෂ.
7. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මළගනේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වළගම්බා පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ පැරණි ප්‍රාකාරය.
8. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නැටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි , නුවර කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි චෛත්‍ය පාදම, ආසනඝරය, පැරණි සෙල්ලිපි, බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් සහ ලෙන් විහාරය.
9. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නහල්ල පැරණි අම්බලම.
10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පොල්කුඹුර සාගල්ලිපුර පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් 05, පර්වත ලිපිය සහ ගල්කණු
11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 569 දෙල්විට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙල්විට පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පානගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පානගමුව බාඹරුව පුරාණ විහාර භූමියට අයත් පැරනි ප්‍රතිමා ගෘහය සහ කටාරම් කෙටූ ලෙන් තුන.
13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගනේගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වේරගොඩ පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල සහ ගල්කණු.
14. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පහල ඕගොඩපොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි

විල්ගම්වෙහෙර පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල, ගල්කණු, ශිලාලිපිය සහ ගල් පර්වතයේ කොටා ඇති පියගැටපෙල.

15. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 586 මහවෙල ග්‍රාම නිලධාරි වසමේ පාදෙනිය ග්‍රාමයේ පිහිටි විල්ගම්වෙහෙර පුරාණ විහාර භූමියට අයත් ශිලා ලිපිය, පැරණි දාගැබ හා ඒ අවට විසිරී ඇති පුරා විද්‍යාත්මක අවශේෂ.

16. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 624 අක්කර පනහ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අලවල ග්‍රාමයට අයත් අලවල ශිලා ලිපිය.

17. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 603 රම්බඩගල්ල ග්‍රාමයේ පිහිටි පෙත්මගයාය පුරාවිද්‍යා ස්ථානයට අයත් ශිලාලේඛන හතර සහ කටාරම් සහිත ලෙන් 5 ඇතුළු අනෙකුත් පුරාවස්තු.

18. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 601 ඕගොඩපොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොට්ටංග ගමට අයත් කොට්ටංග ශිලාලිපිය.

19. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 539 කොටුහේන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී විශුද්ධාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ස්ථූපය සහ ගොඩනැගිලි නටබුන්.

20. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වතුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වතුවත්ත ශ්‍රී සුනන්දාරාම විහාර භූමිය තුළ පිහිටා ඇති ටැම්පිට විහාරය සහ පෝය සීමා තුළ ඇති දාගැබ.

21. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරවඩුන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

22. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුපොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, තිස්සව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කුඹුක්වැව ශ්‍රී නාගරුක්ඛාරාම විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

23. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 489 දොළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දොළුව රංකිරිමඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, දික්ගෙය පිහිටි ගලෙහි කෙටූ සිරිපතුල, ලෙන් ලිපිය සහිත ලෙන.

24. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බණ්ඩාරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බණ්ඩාරගල බෝගහමුල්ලවත්ත කළුගල නමැති ස්ථානයේ ඇති ශිලාලේඛනය, කණු පාදම්ගල් ගොඩනැගිලි අවශේෂ, ගල්කණු සහ පැරණි චෛත්‍යය.

25. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සාලියගම පළාත අංක 343 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මංගලාරාම ගනේකන්ද රජමහා විහාර භූමියට අයත් මහනුවර යුගයේ සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය, කටාරම් සහ ශිලාලේඛන සහිත සියළුම ලෙන්, පර්වතයේ කොටා ඇති සිරිපතුල්ගල, ගල්කුළුණු සහ දාගැබ.

26. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔග්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කළුගල්ල ග්‍රාමයේ පිහිටි ශ්‍රී නීලගිරි රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, පර්වත මුදුනේ ඇති චෛත්‍යය නටබුන් සහ භූමියේ විසිරී ඇති වෙනත් පුරාවිද්‍යාත්මක නටබුන්.

27. වයඹ පළාතේ, කුරුණෑගල දිසත්‍රික්කයේ, රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 267 ග්‍රාම නිලධාරී වසමේ හේනේගෙදර ග්‍රාමයේ ලොට් අංක 80 දරන කළුගල සහිත ප්‍රදේශයේ පිහිටි කටාරම් සහිත ලෙන සහ දැගැබ් ගොඩැල්ල.

28. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 166 කෝන්වැව වදකහගල පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

29. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 206 පොතුවැව ග්‍රාම නිලධාරී වසමේ ගුරුගොඩ ග්‍රාමයේ පිහිටි ශ්‍රී ශාක්‍යමුණි විහාර භූමියට අයත් ඉපැරණි ගල්කණු සහිත නටබුන් ප්‍රදේශය.

30. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 138 කට්ටඹුවාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දියබැටේ පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ ලෙන, සෙල්ලිපි 02, ගිරිලිපි 04.

31. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 524 මහවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහවැව නාගාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

32. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවීදිය ග්‍රාමයේ පිහිටි බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් පරිපාලන නිලධාරීන්ගේ නිල නිවාසය.

33. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලේපොල උතුරු ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වේළුවනරාම පුරාණ විහාරයේ භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය සහ අටුව.

34. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාගොල්ල ග්‍රාම නිලධාරී වසමට අයත් පැරණි පිංතාලිය

35. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොට්ටල ග්‍රාම නිලධාරී වසමට අයත් ශුද්ධ වූ එමානුවෙල් දෙව් මැදුර.

36. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩවෙල උඩගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හන්තාන රජමහා විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ ආවාස ගෙය.

37. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුගන්නාව ග්‍රාම නිලධාරී වසමේ කඩුගන්නාව නගරයේ පිහිටා ඇති ඓතිහාසික ඩෝසන් කුළුණ.

38. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 432 ග්‍රාම නිලධාරී වසමේ ඇන්විල්වත්ත නමැති ඉඩමේ පිහිටා ඇති සීතා ලෙන නමින් හඳුන්වන කටාරම් කෙටූ ගල්ලෙන.

39. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේන්පිට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇඹුල්ගම රජමහා විහාර භූමියට අයත් උඩමළුවේ පිහිටි කටාරම් සහිත ගල්ලෙන් දෙක සහ පහත මළුවේ පිහිටා ඇති පැරණි ආවාස ගෙය.

40. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කූරගල කන්දේ ඇති ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාස සාධන සහිත ස්වභාවික ලෙන.

41. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මැද කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාළිගාවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාළිගාවත්ත මුස්ලිම් සුසාන භූමියේ ඇති හුසේන් ලෙබ්බේ නමැත්තාගේ සුසානය, මස්තාන් මවුලානා නමැත්තාගේ සොහොන් ගෙය සහ අෂ්ඨාකාර සොහොන් ගෙය.

42. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බාන්ස් ප්‍රදේශයේ පිහිටි බාන්ස් හෝල් ඉඩමට අයත් පැරණි නිවස.

43. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 187/ඒ පහල කුඩලිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බුලත්වතුකන්ද නමැති කන්දේ ගල්තලාවක් මත පිහිටා ඇති පාදම් කණු වලවල් සහිත ගොඩනැගිලි අවශේෂ ස්ථානය.

44. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්වල ග්‍රාමයේ හල්වල කඳු මුදුනේ පිහිටා ඇති පවුරේ කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

45. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිරිකුළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ශ්‍රී සුබෝධාරාම පුරාණ විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

46. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමනබැද්ද 416ඒ ග්‍රාම නිලධාරී වසමේ සමනබැද්ද ගමේ පිහිටි ගනේඋඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ගල්ලෙන්, පොකුණ, පඩිපෙල සහ ශිලාලිපි.
47. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හීනටිගහමුන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොට්ටඹ ශ්‍රී සුභද්‍රාරාම විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
48. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩේ වීදිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අනගාරික ධර්මපාල මාවතෙහි වරිපනම් අංක 26 දරන ස්ථානයේ ඇති පැරණි නිවස (ආරච්චි වලව්ව)
49. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උයන්වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාතර තාරකා කොටුව ආසන්නයේ ඇති පැරණි ප්‍රකාරය සහ වෙඩි බෙහෙත් ගබඩාව.
50. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 433සී ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙවිනුවර සිංහාසන මාවතේ වරිපනම් අංක 40 දරන පී. එම්. කනකරත්න ද සිල්වා මහතාට අයත් පැරණි නිවස (රේන්ද ගෙදර)
51. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පලල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැලිගම කෝවි ලකන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
52. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 25 මධ්‍යම ඇල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේගොඩ රජමහා විහාරය භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව චෛත්‍යය පොකුණ සහ ශිලා කුළුණ.
53. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හඹරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොන්ස්විටා 137බී ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රුමස්සල පැරණි කුළුණ.
54. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වවුලාගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගෝනාපීනුවල ශ්‍රී ශෛලකූඨාරාම පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ පැරණි චෛත්‍යය.
55. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කතළුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කතළුව අටදාහේ වලව්ව හා ප්‍රකාරය.
56. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්නපුර නගර බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්නපුර බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 4 දරන ස්ථානයේ පැරණි ගොඩනැගිල්ල.
57. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නපුර නගර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවතේ වරිපනම් අංක 1/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.
58. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නපුර නගර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්නපුර ඕලන්ද කොටුව තුළ පිහිටා ඇති වරිපනම් අංක 58/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.
59. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙරළුප ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දේවාලේගාව ගල්කඩුව පුරාණ ගල්ලෙන් විහාරය.
60. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්ගස්මංකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැලිපත පුහුල්යාය පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් (විදර්ශන ගල්ලෙන් විහාරය) බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කොටන ලද ගල්ලෙන.
61. සබරගමුව පළතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියවින්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේලන්දගම දියවින්න දේවගිරි පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් පැරණි ලෙන් විහාරය සහ කටාරම් කෙටූ ලෙන් දෙක.
62. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවලතැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහවලතැන්න ශ්‍රී චන්ද්‍රසේකර මුදලින්දාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ හේවිසි මණ්ඩපය.
63. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙදරන්ගමුව ග්‍රාමයට අයත් මඩුවන්වල පරපුරේ සොහොන් භූමිය.
64. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දික්වෙලේගොඩ ග්‍රාමයට අයත් පැරණි දාගැබ.
65. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළොන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොළොන්න පුරාණ විහාර භූමියට අයත් (අත්තථාරාම පුරාණ විහාරය) පැරණි බුද්ධ ප්‍රතිමාව.
66. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 210 දාපනේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දාපනේ ශ්‍රී ජයසුන්දරාරාම රජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.
67. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 208 කඹුරුගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හල්වින්න ශ්‍රී ජයමහා විහාර භූමියට අයත් පැරණි විහාර මන්දිරය.
68. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කපුහේන්තොට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පනාවැන්න අභයතිලකාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ප්‍රකාරය.
69. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකඳුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාකඳුර පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර සහ මූර්ති සහිත ප්‍රතිමා ගාහය, ආවාස ගෙය සහ ප්‍රකාරය.
70. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟුල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හිඟුල රජමහා විහාරය භූමියට අයත් ටැම්පිට විහාරය.
71. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූනාගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බ්‍රෝටන් වතුයායේ ඉදිකර ඇති බ්‍රෝටන් බංගලාව, ගවමඩුව හා කාර්යාල ගොඩනැගිල්ල.
72. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණුවතුර බුබුල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙහෙරගල ග්‍රාමයට අයත් කටාරම් සහිත ලෙන් සමූහය, පර්වත ලිපිය, පැරණි ස්ථූප ගොඩැල්ල.
73. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 87 ගෝතමීපුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගෝතමීපුර ග්‍රාමයේ ගෝතමී විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත විහාර ගෙය.

ඉහත කී නියමය කිරීමට එරෙහි විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2007 ජනවාරි මස 19 වැනි දින හෝ එදිනට පෙර පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනයට එවිය යුතුය. එවැනි සෑම විරෝධතාවයක් ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර එම විරෝධතාව ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද එම හේතු පිළිබඳ ප්‍රකාශනයක් එම ලිපියෙහි අන්තර්ගත විය යුතුය.

මහින්ද යාපා අබේවර්ධන,
සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2006 දෙසැම්බර් මස 06 වැනි දින කොළඹ දී ය.

01-24

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : එන් (පීබීඑස්) 305.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ඇග්රෝ ටෙක්නිකා මාර්කටිං ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1991.12. 02 දින සංස්ථාපිත සමාගමක් වන ඇග්රෝ ටෙක්නිකා මාර්කටිං ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඇග්රෝ ටෙක්නිකා මාර්කටිං ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01–11

---

මගේ අංකය : එන් (පීවීඑස්) 8197.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ජයබිම මල්ටි ට්‍රේඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1991.10.07 දින සංස්ථාපිත සමාගමක් වන ජයබිම මල්ටි ට්‍රේඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ජයබිම මල්ටි ට්‍රේඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01-09

---

මගේ අංකය : එන් (පීවීඑස්) 6961.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ඇලුෆැබ් හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1990.11.08 දින සංස්ථාපිත සමාගමක් වන ඇලුෆැබ් හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඇලුෆැබ් හාඩ්වෙයාර් (ප්‍රයිවෙට්) ලිමිටඩ්හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01–08

---

මගේ අංකය : එන් (පීවීඑස්) 6241.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ එල්. එම්. බයින් ඔෆීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1990.03.22 දින සංස්ථාපිත සමාගමක් වන එල්. එම්. බයින් ඔෆීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එල්. එම්. බයින් ඔෆීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01–07

මගේ අංකය : එන් (පීවීඑස්) 7362.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ෆීනික්ස් පැකේජින් (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1991.02.27 දින සංස්ථාපිත සමාගමක් වන ෆීනික්ස් පැකේජින් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ෆීනික්ස් පැකේජින් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01-06

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/67382/බී2/131.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.03 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. අබේරත්න විසින් සහතික කරන ලද 1999.12.04 දින හා අංක 5638 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම වැබොඩ පදිංචි කැප්පෙටි පතිරන්නැහැලාගේ සිරිවර්ධන සහ හපුආරච්චි ඉන්ද්‍රානි පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.03.26 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ හත් දහස් අටසිය පනස් එකයි ශත අසූඅට (රු. 3,07,851.88) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5638 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අනූ එකයි ශත පනස් දෙක (රු. 91.52) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3 හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ වැබොඩ පිහිටි ගොඩපරගහ වත්ත *නොහොත්* ගොරකගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එන්. සෙනෙවිරත්න විසින් 1992.01.26 දින සකසන ලද අංක 1255 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 01 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16 ක් වූ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද එකී 1255 පිඹුරේ කැබලි අංක 4 මගින් දක්වා ඇති මාර්ග අයිතීන්ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2006 ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-125/1

---

මගේ අංකය : එන් (පීවීඑස්) 36186.

## 1982 අංක 17 දරන සමාගම් පනත

### 373(3) වගන්තිය යටතේ ටෙලිකොම් සිටි (ප්‍රයිවෙට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම

සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.12.29 දින සංස්ථාපිත සමාගමක් වන ටෙලිකොම් සිටි (ප්‍රයිවෙට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ටෙලිකොම් සිටි (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

01-05

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 8/73349/ඉසෙඩ් 8/592.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.104.05 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සී. කේ. ඩබ්. සෙනෙවිරත්න විසින් සහතික කරන ලද 2002.08.22 දින හා අංක 6801 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම ගාල්ල පදිංචි මුදුගමුව ආරච්චිගේ ඉන්ද්‍රානි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හතලිස් හත්දහස් විසි දෙකයි ශත අසූ දෙක (රු. 4,47,022.82) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 6801 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැට දෙකයි ශත අනූ හත (රු. 162.97) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර සීමාවේ, උළුවිටිකේ පිහිටි බේරුගොඩ කනත්ත වත්ත හා දික්දෙනියේ වත්ත නම් වූ ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. එන්. ඩබ්. ලියනගේ විසින් සකසන ලද 2002.01.23 දින සහ අංක 3,182 දරන මිණුම් පිඹුරේ කැබලි අංක ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 23 ක් වූ බෙදා වෙන් කල ඉඩම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-125/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/38138/සීඩී5/530.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.02.20 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සභාරත්නම් විසින් සහතික කරන ලද 1999.11.15 දින හා අංක 8241 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම කඩුවෙල පදිංචි හිටිනායක මුදියන්සේලාගේ ඉන්ද්‍රපාල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.09 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස් දහස් පනහයි ශත දහය (රු. 240,050.10) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 8241 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූපහයි ශත හතලිස් හතර (රු. 85.44) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභාවේ, කඩුවෙල උප කාර්යාල සීමාව තුළ බෝමිරියේ මල්වාන ප්‍රධාන පාරේ සිට නැගෙනහිර දෙසට ඇති රස්සපාන පාර වරිපනම් අංක 50/3 හි පිහිටි බටදොඹගහවත්තේ නැගෙනහිර කොටසේ කැබලි අංක 1 නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් සකසන ලද 1998.12.07 දින සහ අංක 836 ඒ දරන පිඹුරේ කැබලි අංක 3 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද ඉහත කී පිඹුරේ කැබලි අංක 1 (පාර) සහ බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් සැකසුණු 1998.11.03 දිනැති හා අංක 836 දරන පිඹුරේ කැබලි අංක 2 මගින් දක්වා ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2006 ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01–125/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/29987/සීඩී1/507.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2005.06.15 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ධර්මගුණවර්ධන විසින් සහතික කරන ලද 1996.10.15 දින හා අංක 1160 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, පන්නිපිටිය පදිංචි ජගත් රෝහණ වීරසිංහ සහ නිරූපා ස්වර්ණමාලි මානගේ වීරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.05.17 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ තිස් හයදහස් තුන්සිය හතලිස් නවයයි ශත හැටහත (රු. 1,36,349.67) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 1160 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් පනස්අටයි ශත දහනවය (රු. 58.19) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ජේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කොට්ටාව ග්‍රාමයේ පිහිටි කොට්ටාව එස්ටේට් හෙවත් සිරිමල්වත්ත එස්ටේට් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. සෙනෙවිරත්න විසින් සකසන ලද 1991.05.14 දිනැති හා අංක 6471 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 115/ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 8.06ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි හා සියළු වගාවන් සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-125/4

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කළින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0104401563.

ණයකරුගේ සම්පූර්ණ නම : ඉනෝකා හේමාලි හෙට්ටිආරච්චි සහ විතානගේ පොඩිහාමිනේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් බී. හෙට්ටිආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 5002 හා 2002.11.29 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැත්තෑඑක්දහස් හාරසිය අසූතුනයි ශත පනස්අටක (රු. 2,71,483.58) ක මුදලක් වර්ෂ 2005.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ විසිහතරදහස් හත්සිය විසිතුනයි ශත පනස්හයක (රු. 2,24,723.56) ද වර්ෂ 2005.09.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස්හයදහස් හත්සිය හැටයි ශත දෙකක් (රු. 46,760.02) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හැත්තෑඑක්දහස් හාරසිය අසූතුනයි ශත පනස්අටක (රු. 2,71,483.58) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ විසිහතරදහස් හත්සිය විසිතුනයි ශත පනස්හයක (රු. 2,24,723.56) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2005.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ ජනවාරි මස 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ, ගෝනහේන ග්‍රාමයෙහි පිහිටි හොරගහවත්ත නමැති ඉඩමට 2001.12.21 දින කේ. ඒ. රූපසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1007/2001 පිඹුර ප්‍රකාර ලොට් 7ඩීට මායිම්,

උතුරට : එම ඉඩමේම ලොට් 7 සී සහ ලොට් 7 බී ද, නැගෙනහිරට : ලොට් 7බී සහ ලොට් 7ඒ ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද, බස්නාහිරට : එම ඉඩමේම ලොට් 6 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0. රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 622/196හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

01-112

---

මගේ අංකය : එන් (පීවීඑස්) 8235.

**1982 අංක 17 දරන සමාගම් පනත**

**373(3) වගන්තිය යටතේ ඇට්කෝ රෙෆ්රිජරේෂන් ස්පෙයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම කපා හැරීමේ දැන්වීම**

සමාගම් පනතේ විධිවිධාන යටතේ 1991.10.15 දින සංස්ථාපිත සමාගමක් වන ඇට්කෝ රෙෆ්රිජරේෂන් ස්පෙයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට ඇට්කෝ රෙෆ්රිජරේෂන් ස්පෙයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම සමාගම් පනතේ 373(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර්.

2006 දෙසැම්බර් මස 05 වැනි දින,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.
කොළඹ 10.

01-10

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ටිශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයබ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.*- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2007**

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2007.01.05 | සිකුරාදා | 2006.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.12 | සිකුරාදා | 2006.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.19 | සිකුරාදා | 2007.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.01.26 | සිකුරාදා | 2007.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2007.02.02 | සිකුරාදා | 2007.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.09 | සිකුරාදා | 2007.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.15 | බ්‍රහස්පතින්දා | 2007.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.02.23 | සිකුරාදා | 2007.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2007.03.02 | සිකුරාදා | 2007.02.15 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.03.09 | සිකුරාදා | 2007.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.16 | සිකුරාදා | 2007.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.23 | සිකුරාදා | 2007.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.03.30 | සිකුරාදා | 2007.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.